053971
2016/06/30
ML/PR

# ශ්‍රී ලංකාවේ රොඩී ජන සමාජයේ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය පිළිබඳ අධ්‍යයනයක්

03 APR 2014

ඒ. වී. මුදිතා කුමාරි අංකුඹුර

FGS/LISC/MC/09/005

කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධයකි.

2014

053971

## සාරාංශය

**මූලික පද :** සංස්කෘතික උරුමය, අස්පර්ශ්‍ය සංස්කෘතිය, රොඩී ජනතාව, දැනුම කළමනාකරණය, දේශීය දැනුම, ශ්‍රී ලංකාව

කිසියම් පුද්ගලයෙක් හෝ සමාජයක් විසින් සිය සංස්කෘතික උරුමයේ කොටසක් වශයෙන් පවත්වාගෙන එනු ලබන ව්‍යවහාරයන් නිරූපණයන්, ප්‍රකාශනයන්, දැනුම හා කුසලතා ආදිය අස්පර්ශ්‍ය සංස්කෘතිය යනුවෙන් හැඳින්වේ. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන කණ්ඩායමක් වන රොඩී ජන සමාජයේ පවත්නා අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය හඳුනා ගැනීම, ඒවා එක් රැස් කිරීම, විධිමත් ආකාරයට වාර්තා කිරීම හා මතු පරපුර උදෙසා සංරක්ෂණය කර තැබීම තුළින් දැනුම කළමනාකරණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.

මේ සඳහා ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ පිහිටි වටගොඩ, කනතොලුව, වඳුරැස්ස, ලෝකුරුගම, කලුවිලපොතාන, පාලුගම සහ කුරුලුබැද්ද යන රොඩී ගම්මාන තෝරා ගන්නා ලද අතර විනිශ්චිය නියැදි ක්‍රමය ඔස්සේ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයන් සුරැකිව පවත්නා පුද්ගලයන් හඳුනාගෙන ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා තොරතුරු රැස් කරන ලදී. යුනෙස්කෝව විසින් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය වර්ග කර දක්වා තිබෙන ප්‍රධාන ක්ෂේත්‍ර වන සමාජ චර්යා, චාරිත්‍ර වාරිත්‍ර හා උත්සව අවස්ථා, ස්වභාව ධර්මය හා විශ්වය සම්බන්ධයෙන් වන දැනුම හා හුරුපුරුදු, භාෂාව හා සාහිත්‍යය, ප්‍රාසාංගික කලා සහ පාරම්පරික ශිල්ප සහ කර්මාන්ත යන ක්ෂේත්‍ර පහ සහ ඒ යටතේ ගැනෙන අනු ක්ෂේත්‍ර 13ක් ඔස්සේ මෙහිදී රොඩී ජන අස්පර්ශ්‍ය සංස්කෘතිය පිළිබඳව තොරතුරු වාර්තා කරන ලදී.

අධ්‍යයනයේදී රැස් කරගත් දත්ත රොඩී ජන අස්පර්ශ සංස්කෘතික උරුමය සුරැකිව පවත්නා මූලාශ්‍ර, අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ ස්වරූපය එහි ව්‍යුහය හා ඒවා සම්ප්‍රේෂණය වන ආකාරය, වත්මන් සමාජය තුළ අස්පර්ශ්‍ය සංස්කෘතිකාංගයන්ගේ ප්‍රයෝගික භාවිතය, අස්පර්ශ්‍ය සංස්කෘතිය සුරැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හෝ ලැබී තිබෙන අනුග්‍රහය සහ රොඩී ජනයාගේ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ පැවැත්ම හා සංවර්ධනය සඳහා එල්ල වී තිබෙන අභියෝග සහ ගැටලු යන කරුණු ඔස්සේ විශ්ලේෂණය කරන ලදී.

ඒ අනුව පාරම්පරික අස්පර්ශ්‍ය සංස්කෘතිකාංගයන් බිහිවීමට මුල් වූ ජන කොට්ඨාස අභාවයට යාමත් සමඟ ම ඔවුන් සතුව පැවති අනන්‍ය වූ අස්පර්ශ්‍ය සංස්කෘතිකාංග ද පරිහාණියට ලක්වෙමින් පවත්නා බව පැහැදිලි විය. ඒ අනුව සාම්ප්‍රදායික රොඩී ජන සමාජයේ පැවති අස්පර්ශ්‍ය සංස්කෘතිකාංග අතරින් අද වන විට ජීවමානව දැකිය හැකි වන්නේ ඔවුන්ගේ දෛනික ජීවිතය හා අනිවාර්යයෙන් බැඳුණු අංග හෝ ආර්ථික උපයෝගිතාවන් උදෙසා පවත්වාගෙන එනු ලබන සංස්කෘතිකාංග පමණි.

ඇතැම් සංස්කෘතිකාංගවල ප්‍රායෝගික උපයෝගීතාව හීන වී යාම, අස්පර්ශ්‍ය සංස්කෘතිය භාවිතයේ, සම්ප්‍රේෂණය කිරීමේ සහ ඉදිරියට පවත්වාගෙන යාමේ දුර්වලතා, ඇතැම් සංස්කෘතිකාංග සක්‍රියව පවත්වාගෙන යාමට අවශ්‍ය පරසරය සහ අමුද්‍රව්‍ය හිඟවීම, නිසි අනුග්‍රහයක් නොලැබීම, සාම්ප්‍රදායික අස්පර්ශ්‍ය සංස්කෘතිකාංගයන්හි වටිනාකම පිළිබඳව නිසි අවබෝධයක් නොමැතිකම ආදිය රොඩී ජන අස්පර්ශ්‍ය සංස්කෘතියේ පරිහාණිය කෙරෙහි බලපා තිබේ. කෙසේ වෙතත් රොඩී ජන සමාජයේ පවත්නා අස්පර්ශ්‍ය සංස්කෘතිකාංග මුලුමණින් ම අභාවයට යාමට මත්තෙන් ඒවා විධිමත් ලෙස එක්රැස් කර වාර්තාගත කර තැබීමත්, අස්පර්ශ්‍ය සංස්කෘතියේ සංවර්ධනය සහ පැවැත්ම සිදුවන ආකාරයට එය භාවිතයට ගැනීමත්, නිසි සංරක්ෂණ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඒවා ආරක්ෂා කිරීමත් අනිවාර්යෙන් සිදු කළ යුතුව තිබේ.

## Abstract

Sri Lanka is a country enriched with unique Intangible Cultural Heritage (ICH). ICH is the collection of practices, representations, expressions, knowledge and skills associated with a person, group of people or communities, as a part of their cultural heritage. There are several primitive groups of people and indigenous communities who sustained their own ICH in Sri Lanka. "Rodee people" are one of those communities who lives separately from other communities within their own social cultural background. The main objective of this study was management of knowledge by identifying, collecting, recording and conservation of the ICH of Sri Lankan Rodee people.

Rodee people are scattered across the country in three provinces. Seven Rodee villages in North Western province, Sri Lanka were selected as the sample for this study. Data were collected by conducting interviews with the people who were selected using purposive sampling method. Participatory observation was also used as a data collection tool for this study.

In this study ICH of Rodee people were identified and recorded according to the following five main categories and 13 sub categories.

- Social practices, rituals and festive events
- Knowledge and practices concerning nature and the universe
- Oral traditions and expressions, including language
- Performing arts
- Traditional craftsmanship

By analyzing data, it is revealed that a unique ICH is being decaying with the extinction of the indigenous people who created and make practice of the ICH. Hence, only ICH items with economical value or associated with their day to day life are alive among in the current Rodee community.

The study concludes that inadequate of practicing, transmitting and persevering of ICH and the meager supporting of government authorities in continuing and safeguarding of ICH are directly caused for the extinction of ICH of Rodee people. However, it is essential to make urgent necessary actions by the responsible bodies to identify, collect, record and safeguard the ICH in a proper way and utilize them in a way that helps to protect and develop the ICH before its total annihilation.


**Key words: Cultural heritage, Intangible culture, Rodee people, Knowledge management, Indigenous knowledge, Sri Lanka**